# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 14,930/9 — 1970 නොවැම්බර් 3 වැනි අඟහරුවාදා — 1970.11.3**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV වැනි කොටස — පළාත් පාලනය

**(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)**

## පළාත් පාලන නිවේදන

### නගරසභා ආඥාපනත

**184 වැනි වගන්තිය යටතේ ආඥාව**

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 184 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, වවුනියාව නගර සභාවේ සභාපති මයිල්වාගනම් පොන්නයියා මහතා සම්බන්ධයෙන්—

(අ) එකී ආඥාපනතින් පැවරී ඇති රාජකාරි කටයුතු ඉටු කිරීම ඕනෑකමින් පැහැර හැරීම සහ එම රාජකාරි කටයුතු ඉටු කිරීමෙහිලා විෂමාචාරයෙන් කටයුතු කිරීම,

(ආ) අදක්ෂතාවය සහ අයථා පාලනය, හා

(ඇ) එකී ආඥාපනතින් පැවරී ඇති බලතල අයථා අන්දමින් පරිහරණය කිරීම,

යන මේවා ඔප්පු වන ප්‍රමාණවත් සාක්ෂිත තිබෙන බවට මා සෑහීමට පත්ව සිටින බැවින් මේ ආඥාවෙන් එකී මයිල්වාගනම් පොන්නයියා මහතා එකී නගර සභාවේ සභාපති ධුරයෙන් ඉවත් කරමි.

ෆී ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1970 නොවැම්බර් මස 3 දින,
කොළඹ දීය.

11–281


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.

784/1—ජේ 17842—5,700 (70/10)